**සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2019**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1.1 මතය ව්‍යාචනය

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 66 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ සිට මාස 12 ක් තුළ කල්පිරෙන වත්කම් පමණක් ජංගම වත්කම් වශයෙන් වාර්තා කළ යුතු වුවද, පැල්වත්ත අංශයේ 2024 අප්‍රේල් 22 දින කල් පිරෙන රු.43,544,918 ක ස්ථාවර තැන්පතුවක් හා සෙවනගල අංශයේ 2021 හා 2022 වර්ෂ අවසානයේදී කල් පිරෙන රු.100,000,000 ක ස්ථාවර තැන්පතු 03 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2014 වර්ෂයේ සිටම ජංගම වත්කම් යටතේ දක්වා ඇති මෙම ස්ථාවර තැන්පතු ඉදිරියේදී අවුරුදු 5 ක් සඳහා ආයෝජනය කර ජංගම නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ සිට මාස 12 ක් තුළ කල්පිරෙන වත්කම් පමණක් ජංගම වත්කම් වශයෙන් වාර්තා කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතු වුවත්, පැල්වත්ත හා සෙවනගල අංශයන්හි පිළිවෙලින් රු.1,027,194,679 ක් හා රු.230,931,560 ක් වූ ගොවි ණය සඳහා පිළිවෙලින් රු.499,299,398 ක් හා රු.9,242,963 ක අඩමාන ණය වෙන් කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. | අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය ඉදිරි ගිණුම් වාර්තා තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | අඩමාන ණය වෙන් කිරීමේප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඇ)සෙවනගල අංශයේ 2019 වර්ෂය තුළ මුදලින් ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.65,771,479 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලැබිය යුතු පොලිය ද ඇතුළත්ව එම අගය රු.113,015,414 ක් වශයෙන් රු.47,243,935 ක් වැඩියෙන් දක්වා තිබුණි | නිවැරිදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ගලා ඒම් හා මුදල් ගලායාම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |
| (ඈ) පැල්වත්ත අංශයේ ගොඩනැඟිලි, යන්ත්‍ර සූත්‍ර උපකරණ, වාහන හා කෘෂි උපකරණ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013 හා 2014 වර්ෂයන්හිදී තක්සේරු කර ලබාදුන් වාර්තා අසම්පූර්ණ බවට මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණු නමුත් එතැන් සිට 2019 වර්ෂය අවසානය දක්වාම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 34 ඡේදය ප්‍රකාරව වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකර පවරාගත් අවස්ථාවේ තිබුණු පොත් අගයන් එලෙසම ගිණුම්වල දක්වා තිබුණි. ඒ අනුව ලේඛනගත සියලු වත්කම් ඒ ආකාරයට පවතින බවටත්, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පිරිවැය රු.4,334,737,840 ක් හා ශුද්ධ අගය | ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ සහයෙන් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණන කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.1,547,310,647 ක් වූ වත්කම් නිවැරදි බවටත් පිළිගත නොහැකිව ඇත. | | |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර තිබුණු පැල්වත්ත අංශයේ රු.842,146,226 ක් හා සෙවනගල අංශයේ රු.99,511,282ක් වූ දේපළ පිරියත හා උපකරණ තවදුරටත් භාවිතයේ පැවතුණු අතර එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ද කටයුතු කර නොතිබුණි. | 2011 වර්ෂයේදී ආයතනය රජයට පවරා ගන්නා අවස්ථාව වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් ද ස්ථාවර වත්කම් ලේඛනය තුළ පැවති අතර ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමටත්, ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) සමාගමට එරෙහිව සේවකයින් හා බාහිර පාර්ශවයන් විසින් පවරා අධිකරණයේ විභාගවෙමින් පවත්නා නඩු, පැල්වත්ත අංශයට13 ක්, සෙවනගල අංශයට 12 ක් හා ප්‍රධාන කාර්යාලයට03 ක් වශයෙන් එකතුව 28 ක් වූ අතර එම නඩුවල වර්තමාන තත්ත්වය සලකා බලා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 84, 85 හා 86 ඡේද ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 ගිණුම් වර්ෂය අවසන් වන විට මෙම නඩුවලට අදාළ වන්දි පිළිබඳව තීරණය වී නොතිබීම නිසා මූල්‍ය වාර්තා තුළ වෙන් කිරීම් සිදු නොකරන ලදී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි උපදෙස් ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ප්‍රකාරව සෙවනගල අංශයට පවරාගෙන තිබුණු ඉඩම් හෙක්ටයාර් 469.1674ක් හා එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලි හා පිරියත යන්ත්‍ර සූත්‍ර තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම නිසා භාවිතයට ගනිමින් පවතින ගොඩනැගිලි හා පිරියත යන්ත්‍ර සූත්‍රවලට අදාළ ක්ෂය වෙන් කිරීම් ද ගිණුම්වලට ඇතුළත් වී නොතිබුණි. | සෙවනගල අංශයට අයත් මෙම ඉඩම් හෙක්ටයාර් 469.1674 වන භූමි ප්‍රමාණයේ දැනට අනවසර පදිංචිකරුවන් සිටින බැවින් එම නිවාස අත්පත් කරගැනීමට නොහැකි වී ඇත.මෙම ඉඩම් සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු අවසන් වෙමින් පවතින අතර ඉන් පසු එහි පිහිටි ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර පොත්වලට ඇතුළත් කොට ක්ෂය කිරීමට කටයුතු කරනු ඇත. | සමාගමට අයත් ඉඩම් හා ගොඩනැඟිලිවල අයිතිය තහවුරු කර ගැනීමටත්, ඒවා ලේඛනගත කර ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) සෙවනගල අංශයෙන් 2018 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු බදු රු.11,110,023 ක් එම අංශය විසින් 2019 මැයි 24 දින ප්‍රධාන කාර්යාලයට යවා ඇතත් එය සදොස් ලෙස සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවීම් වශයෙන් එම අංශයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, ප්‍රධාන කාර්යාලය විසින් එම බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර සෙවනගල අංශයෙන් ලැබිය යුතු මුදල්වලට හිලව් කරගෙන තිබීමෙන් ගෙවිය යුතු බදු වගකීම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් වී නොතිබුණි. | සෙවනගලඅංශයෙන්2018වසර සඳහා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට ගෙවියයුතු ආර්ථික සේවා ගාස්තු බදු රු.11,110,023ක් එම අංශය විසින් පාලන ගිණුම හරහා ප්‍රධාන කාර්යාලයට යවා ඇත. | රජයට ගෙවිය යුතු බදු මුදල් නියමිත පරිදි ගිණුම් ගැලපීමට හා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සීනි හා සීනි ආශ්‍රිත නිෂ්පාදන මත වැට් බදු අයකිරීමෙන් සමාගම නිදහස් කර තිබියදී සෙවනගල අංශය විසින් පෙර වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.13,922,835ක වැට් බද්දක් අය කර එයින් වියදම් මත ගෙවන ලද රු.10,156,443 ක වැට් බද්දක් ගිණුම්වලින් හිලව් කරගෙන තිබුණි. මේ නිසා සමාගමේ වියදම් රු.10,156,443 ක් අඩුවෙන් දැක්වුණි. | දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් 2008 ජනවාරි 01 දින සිට සීනි හා සීනි ආශ්‍රිත නිෂ්පාදන මත වැට් බදු අය කිරීමෙන් සමාගම නිදහස් කර තිබුණි. | දේශීය ආදායම් කොමසාරිස්ගෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) ගොවි ණය උපලේඛනයේ අය වියයුතු ණය ශේෂයන්ගෙන් රු.1,488,265 ක බැර ශේෂයක් හිලව් කර දක්වා තිබුණි. | ගොවි ණය ශේෂ පසුවිපරම් කිරීමේ දී හඳුනාගත් අත්වැරැදීම් මත ආපසු ගෙවිය යුතු ශේෂය රු. 1,488,265 ක් වේ. | අය වියයුතු ණය ශේෂය ජංගම වත්කම් යටතේ ද,ගෙවිය යුතු ණය ශේෂය ජංගම වගකීම් යටතේ ද දැක්විය යුතුය. |
| (ඉ) සෙවනගල අංශයේ ලෙජර් ගිණුම් 07 ක පෙර වර්ෂයේ රු.1,890,879,751 ක් වූ ශේෂ එකතුව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.1,890,381,939 ක් වශයෙන් රු.497,862 ක් අඩුවෙන් ද, ලෙජර් ගිණුම් 04 ක පෙර වර්ෂයේ රු.1,932,921,284 ක් වූ ශේෂ එකතුව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.2,293,463,140 ක් වශයෙන් රු.360,541,856ක් වැඩියෙන් ද දක්වා තිබුණි. තවද, පෙර වර්ෂය අවසානයේ ශේෂයක් නොතිබුණු වියදම් ගිණුම් 08 ක එකතුව රු.475,703 ක ආරම්භක හර ශේෂයන් ද, එක් වියදම් ගිණුමක රු.2,428,800 ක ආරම්භක බැර ශේෂයක් ද සටහන් කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් පියවිය යුතු වුවත් එසේ සිදු නොකර 2018 වර්ෂයේ ගනුදෙනු 2019 වර්ෂය තුළ ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කිරීම නිසා මෙම දෝෂය සිදුව ඇති බව නිරීක්ෂණය විය. | ගිණුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන මෘදුකාංග තුළ 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් පියවී නොතිබීමෙන් මෙම ශේෂ පෙන්නුම් කෙරේ. | වර්ෂය අවසානයේදී ගිණුම් පියවා නිවැරදි ශේෂය ඉදිරියට ගෙන යා යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සෙවනගල අංශයේ කෙරීගෙන යන වැඩ වටිනාකම වන රු.29,932,255 ක් සදොස් ලෙස වර්ගීකරණය කර දේපළ පිරියත හා උපකරණ වටිනාකමට එකතු කර එක් අයිතමයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා තිබීමෙන් දේපළ පිරියත උපකරණවල ශුද්ධ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එළඹෙන වර්ෂයේ දී නිවැරැදි කිරීමට කටයුතු කරනු ඇත. | කෙරීගෙන යන වැඩ දේපළ පිරියත හා උපකරණ යටතේ වෙනම දැක්විය යුතුය. |
| (උ)සෙවනගල අංශය සතුරු. 285,000,000 ක ස්ථාවර තැන්පතු 07 ක් බැංකු ණය හා බැංකු අයිරා පහසුකම ලබා ගැනීම සඳහාඇපයට තබා තිබීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. | එළඹෙන වර්ෂයේදී නිවැරැදි කිරීමට කටයුතු කරනු ඇත | සමාගම සතු ස්ථාවර තැන්පතු ඇප තැබීම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඌ)2019 දෙසැම්බර් 31 දිනට සෙවනගල අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු වටිනාකම රු.788,059,004 ක් වුවද, ස්ථාවර තැන්පතු උපලේඛනයේ ඇතුළත් තැන්පතු 19 ක වටිනාකම රු.711,059,003 ක් විය. වටිනාකම රු.45,000,000 ක් වූ ස්ථාවර තැන්පතු 02 ක් උපලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර රු.23,000,000 ක් වූ තැන්පතු 02 ක් සඳහා සමාගම සතුව තැන්පතු අලුත් කිරීමේ නිවේදන නොතිබුණු බවට නිරීක්ෂණය විය. | 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු.788,059,004 ක්වේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර තැන්පතු වටිනාකම ලේඛනය හා උපලේඛනයෙන් ද, අලුත් කිරීමේ නිවේදනවලින් ද සනාථ විය යුතුය. |
| (එ) 2019දෙසැම්බර් 31 දිනට සෙවනගල අංශයේ තොග භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් රු.501,069,784 ක් වෙනුවට ලෙජරය අනුව වටිනාකම වූ රු.825,392,789 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. එසේම රු.385,097 ක් වටිනා තොග අයිතම 174 ක ඌනතාවයක් හා රු.565,010 ක් වටිනා තොග අයිතම 180 ක අතිරික්තයක් පවතින බවටත්, භාවිතයට ගත නොහැකි හා අපහරණය කළ යුතු රු.6,388,008 ක් වටිනා තොග අයිතම 825 ක් හා බින් කාඩ්වල ඇතුළත් නොකළ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ගබඩාවේ පවතින බවටත් භෞතික සත්‍යාපන වාර්තාවෙහි ඇතුළත් වීමත්, ලැබීම් ගිණුම්ගත නොකළ තොගයකින් නිකුත් කිරීම නිසා තොග ලෙජර් ගිණුම් 04 ක එකතුව රු.235,709,044 ක බැර ශේෂයන් පැවතීමත් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.825,392,789 ක තොග වටිනාකමෙහි නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත් විය නොහැකිව ඇත. | ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් එළඹෙන වර්ෂයේ දී පසු විපරම් කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | තොග සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගනිමින් ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත්, භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඒ)පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ක්ෂය ප්‍රතිපත්තිය අනුව පිරිවැය රු.3,178,861,066 ක්වූක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ (කල් බදු වත්කම් ද සමඟ), වාරි මාර්ග හා විවිධ උපකරණ සහ කර්මාන්තශාලා බලාගාරය හා උපකරණවල ක්ෂය අනුපාතය පිළිවෙලින් සියයට 15 ක්, 6 ක් හා 5 ක් වූ අතර යටිතල පහසුකම් සඳහා ක්ෂය අනුපාතයක් සඳහන් කර නොතිබුණි. එසේ වුවද, එම වත්කම්වලින් පිරිවැය රු.1,618,821,687 ක් වූ වත්කම් කොටසක් සියයට 2 ත් සියයට 25 ත් අතර විවිධ අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා ක්ෂය වෙන් කිරීම්වල නිරවද්‍යතාවය සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකිව ඇත. | 2011 වර්ෂයේ ආයතනය රජයට පවරා ගැනීමේදී පැවති වත්කම් ඒ ආකාරයෙන්ම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්ව ඇත. පැවති ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය අනුපාතවල වෙනස පැවතුණි. ගිණුම්කරණ පද්ධතිය තුළින් අදාළ ප්‍රතිශත වෙනස් කිරීම සිදු කළ නොහැකි හෙයින් ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයත් සමඟ ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | යටිතල පහසුකම් සඳහා නිශ්චිත ක්ෂය අනුපාතිකයක් තීරණය කළ යුතු අතර ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කිරීම සිදු කළ යුතුය. |
| (ඔ) පැල්වත්ත අංශයේ ගබඩාවෙන් නිකුත් කළ භාණ්ඩවල ගත්මිල වෙනුවට එම භාණ්ඩ පන්තියේ අවසානවරට මිලදී ගත් මිලට ගිණුම්වලට සටහන් කර එම වෙනස තක්සේරු ගැලපීම් ගිණුමක් හරහා මූල්‍ය ප්‍රකාශනවල වියදමට ගලපනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ ඒ ආකාරයට වියදම් ශීර්ෂ 04 කට රු.2,065,100 ක් එකතු කර වියදම් ශීර්ෂ 06 කින් රු.2,287,509 ක් අඩු කර දක්වා තිබුණි. තවද, මිල වෙනස් වීම් මත ලද ආදායම ලෙස විකුණුම් පිරිවැය, ආයතන හා පරිපාලන වියදම් හා පුහුණු වියදම්වලින් රු.230,254,054 ක් අඩු කර දක්වා තිබුණි. ගිණුම්කරණ මෘදුකාංගයේ පවතින දෝෂයක් හේතුවෙන් සිදුවන මෙම ගිණුම් ගැලපීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඒ ඒ වියදම් අයිතමයන්හි නිවැරදි වියදම නිරූපනය නොවන බවට නිරීක්ෂණය විය. | 1999/2000 වර්ෂයේ සිට භාවිතා කරන පද්ධතිය තුළ ස්වයංක්‍රීයව මෙම තත්ත්වය සිදුවේ. 2022 වසරේ ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන ගිණුම්කරණ පද්ධතිය තුළින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ඒ ඒ වියදම් අයිතමයන්හි සත්‍ය වියදම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය විය යුතුය. |
| (ඕ) 2014 ජුනි 30 දින රු.42,529,510 කට මිලදී ගෙන 2018 ජූලි 07 දින ගින්නෙන් විනාශ වී තිබුණු පැලවත්ත අංශයේ සීනි කැට බවට පත් කිරීමේ Modification Automation Factory Plant නැමැති යන්ත්‍රය සඳහා රක්ෂණ භාර අරමුදලෙන් ඉල්ලුම් කරන ලද රු.40,430,655 ක වන්දි මුදලෙන් 2019 වර්ෂයේදී ලැබුණු රු.12,653,693 කින් යන්ත්‍රය අලුත්වැඩියා නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂයක් වශයෙන් දක්වා තිබුණු අතර මෙම ගිනි හානිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොතිබුණි. තවද, පරිහරණය නොකරන මෙම යන්ත්‍රයේ පිරිවැය මත සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වාර්ෂිකව සියයට 5 ක් බැගින් රු.2,126,475 ක ක්ෂය වෙන් කිරීමක් ද සිදු කර තිබුණි. | දෘඩාංගය හා මෘදුකාංගය සඳහා රු.40,430,655 ක වන්දි මුදල් ඉල්ලුම් කළ ද, මෘදුකාංගය සඳහා වන්දි මුදල් ප්‍රතික්ෂේප විය. 2021 වර්ෂය තුළදී යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. නව වත්කම ස්ථාපනය කිරීම සම්බන්ධ ගැලපීම හා හෙළිදරව් කිරීම 2021 වර්ෂයේදී සිදු කරනු ලැබේ. මෘදුකාංගයේ පැවති දෝෂයක් හේතුවෙන් යන්ත්‍රයේ ක්ෂය කිරීම නතර කිරීමට නොහැකි විය. 2021 වර්ෂයේදී නිවැරදි කර ඇත. | යන්ත්‍රය ක්ෂය කිරීම අත්හිටුවා එය අපහරනයට හෝ අලුත්වැඩියාවට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ක)2018 හා 2019 වර්ෂයන්ට අදාළව පැල්වත්ත අංශය විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු බදු රු.31,828,247ක් සඳහා ගිණුම්වලින් වෙන් කිරීම් සිදු කර ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2018 හා 2019 වර්ෂ සඳහා ආර්ථික සේවා ගාස්තු සඳහා ගිණුම්වලින් වෙන් කිරීම් සිදු කර නොමැත. | 2018 හා 2019 වර්ෂ සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතුය. |

**1.5.3 නො සැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) සෙවනගල අංශයේ මූල්‍ය ප්‍රකාශනවල 2019 වර්ෂය සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 2,229,383 | 3,455,540 | 1,226,157 | මෙම වෙනස සම්බන්ධයෙන් දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමඟ පරීක්ෂා කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජාතිය ගොඩනැගීමේ බද්ද අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) සෙවනගල අංශයේ ගොවීන්ගෙන් ලැබිය යුතු ණය | 230,931,560 | 228,713,938 (උපලේඛනය)<br>230,202,208 (කාල විශ්ලේෂණ වාර්තාව) | 2,217,622<br>729,352 | අදහස් දක්වා නොමැත | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොවි ණය ශේෂය උපලේඛනය හා කාල විශ්ලේෂණය සමඟ සැසඳිය යුතුය. |
| (ඇ) 2015/2016 හා 2016/2017 වර්ෂයන්ට අදාළව සමාගමේ ගෙවිය යුතු ආදායම් බදු වගකීම | 225,689,280 | 40,435,876 (දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ පරිගණක බදු දත්ත පද්ධතියෙන් ලබා ගත් තොරතුරු අනුව) | 185,253,404 | වෙනස පිළිබඳව වැඩිදුරටත් පරීක්ෂා කළයුතුව තිබේ. | සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නිවැරදිව ගණනය කරදේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) වසර 02ත් 05 ත් අතර කාලයක සිට රාජ්‍ය ආයතන හා රාජ්‍ය සමාගම්වලින් අයවිය යුතුව පවතිනණය ශේෂයන්ට සහ2012 – 2019 කාලය තුළ සිදු වූ ගනුදෙනු වෙනුවෙන් සෙවනගල හා පැල්වත්ත අංශයන්හි ඒ ඒ අංශයන්ගෙන්ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් සම්බන්ධ ගනුදෙනු | 674,101,828 | ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ විස්තර | මෙමරාජ්‍ය ආයතනසෘජුව භාවක්‍රාකාරව සමාගමසමහසම්බන්ධය ක්පවතින හෙයින් සම්බන්ධිත පාර්ශව වශයෙන් ද, සමාගමේ ඒ ඒ අංශ අතර ගනුදෙනු පාලන ගිණුමක් හරහා ද සිදුවේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සම්බන්ධිත රාජ්‍ය හා පෞද්ගලික සමාගම්වලින් හා සීමාසහිත ලංකා සීනි සමාගමේ ඒ ඒ අංශ අතර සිදුවන ගනුදෙනු වලින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය. |
| (ආ)2015, 2016 හා 2019 වර්ෂවල සෙවනගල අංශය නිපද වූ කාබන්ඩයොක්සයිඩ් වායුව මිලදීගත් පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු මුදල් | 17,770,596 | ශේෂ සනාථ කිරීම් | එළඹෙන වර්ෂයේ දී ශේෂය සනාථ කර ගැනීම් සිදුකර ගැනීමට කටයුතු කරනු ඇත. | ශේෂය සනාථ කිරීම. |
| (ඇ)සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන වියදම් | 51,804,587 | වියදම් විස්තරය | වියදම් විස්තරයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | වටිනාකම් සකස් වූ ආකාරය. |
| (ඈ)පැල්වත්ත අංශයේ ජර්නල් වවුචර් මගින් ලෙජර් ගිණුම් 13 ක හර සටහන් 1,945 ක් මගින් සටහන් කර තිබුණු එකතුව රු.31,000,651 ක් හා බැර සටහන් 47,981ක් මගින් සටහන් කර තිබුණු එකතුව රු.677,211,106 ක ගනුදෙනු | 677,211,106 | ජර්නල් වවුචර්වල පාද සටහන් | පවතින ගිණුම්කරණ මෘදුකාංගයේ ගනුදෙනු සටහන් වීමේදී මෙම අඩුපාඩු ඇති වී ඇත. 2022 වර්ෂයේ නව මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කර ඇත. | ජර්නල් සටහන් සඳහා පාද සටහන්. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) සමාගමේ පෙර අයිතිකරුට අයිති ට්‍රැක්ටර් 20 ක් පැල්වත්ත අංශය විසින් 2011 නොවැම්බර් සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ මාස 98 ක කාලය තුළ භාවිතා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.45,106,891 ක් හා එම අයිතිකරු පැල්වත්ත අංශයට අයත් නිවාස භාවිතා කිරීම නිසා ලැබිය යුතු කුලියට රු.18,135,593 ක් | 26,971,297 | ලිඛිත ගිවිසුමක් භාශේෂ සනාථ කිරීම් | සමාගම ආරම්භයේ සිටම ලිඛිත ගිවිසුමකින් තොරව සිදු කර ඇති මුදල් පියවීම් නොකළ මෙම ගනුදෙනුවලට අදාළ ට්‍රැක්ටර් රථ භාරදීමට හෝ ගිවිසුමක් මත ඒවා භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා නීති අංශය වෙත පවරා ඇත.මෙම සියළු ගනුදෙනු ගිවිසුම්ගත වී මුදල් පදනමට සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ලිඛිත ගිවිසුමහා ශේෂ සනාථන. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පැල්වත්ත හා සෙවනගල අංශයන්හි උක් ගොවීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු පිළිවෙලින් රු.1,027,194,679 ක් හා රු.230,202,208 ක් වූ ණය ශේෂ තුළ වසර 02 ත් වසර 10 කට වැඩි කාලයකත් සිට අයනොවී පවතින පිළිවෙලින් රු.500,580,561 ක් හා රු.56,356,770 ක ණය ශේෂ විය. ණය වාරික අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම, අනවසර භෝග වගාවන් සඳහා යොමුවී ඇති ගොවීන් නැවත උක් වගාවන් සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් නොගැනීම මේ සඳහා හේතු වී ඇති බවට නිරීක්ෂණය විය. | පැල්වත්ත අංශයේ ආයතනය ආරම්භයේ සිට අය නොවූ රු.499,299,398 ක ණය සඳහා අඩමාන ණය වෙන් කර ඇති අතර ඉතිරි රු.527,895,281 ක ණයවලින් 2015 ට පෙර පැවති රු.464,023,067 ක ණය ගොවීන්ගේ අස්වැන්න අඩුවීම නිසා අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඔවුන් උක් වගාව තුළ රඳවා ගැනීම අරමුණු කරගෙන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මත අය කිරීම අත්හිටුවා ඇත. විවිධ පියවර මඟින් ගොවි ණය අයකර ගැනීමේ කටයුතු කරමින් පවතී. සෙවනගල අංශයේ ගොවි ණය සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | නොපමාව ගොවි ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ)පැල්වත්ත අංශය විසින් භාණ්ඩ හා සේවා ලබා ගැනීම පිණිස සැපයුම්කරුවන් 124 දෙනෙකුට ලබා දී තිබුණු වසර 11 සිට 20 දක්වා කාලයක් ගතවී ඇති රු.5,990,286 ක අත්තිකාරම් මුදල් ද,ලෙජර් ගිණුම් 07 ක 2012 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.284,102 ක් හා 2014 වර්ෂයටත් පෙර සේවක සමාජ ශාලාවට ලබාදී තිබුණු ණය රු.1,021,657 ක් ද වශයෙන් එකතුව රු.7,296,045 ක් 2021 සැප්තැම්බර් 30 විගණිත දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදල් නිරවුල් කරමින් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ පවතින රු.284,102 ක ණය ශේෂයෙන් රු.176,155 ක් අය නොවන බව තහවුරු කර ගැනීමෙන් ගිණුම්වාර්තාවලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත. වටිනාකම රු.1,021,657 ක සමාජ ශාලාවට ලබාදී තිබුණු ණය සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | හිඟහිට ඇති ණය අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6.2 ගෙවියයුතුමුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)උක් ගොවීන්ට ගෙවිය යුතු රු.62,850,641 ක්, විවිධ ණයහිමියන්ට ගෙවිය යුතු රු.1,226,088 ක් හා වෙළඳ ණයහිමියන් 17 දෙනෙකුට ගෙවිය යුතු රු.3,462,912 ක් වශයෙන් එකතුව රු.67,539,641 ක් වසර 02 සිට වසර 07 කට අධික කාලයක් නිරවුල් නොවී පැවතීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවිය යුතු ණයහිමි ශේෂ ගෙවීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි ගිණුම් 24 ක් යටතේ ගනුදෙනුකරුවන් ගණනාවකට වර්ෂ 2002 සිට 2018 දක්වා කාලයට අදාළව රු.121,664,307ක් ගෙවිය යුතු බවට සඳහන් වුව දළුම ශේෂ නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනය රජයට පවරා ගැනීමට පෙර සිට පැවති මෙම බොහෝමයක් ණයහිමි ශේෂ ගෙවීමට සිදුවෙතැයි උපකල්පනය කර ඉවත් කිරීමට කටයුතු කර නොමැත. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිරවුල් කිරීමට හෝ සුදුසු පරිදි ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනත 4(i) වගන්තිය | 2019 දෙසැම්බර් 01 දිනට පෙරාතුව අදාළ වූ මෙම නීතිය යටතේ 2012 – 2016 කාල පරිච්ඡේදයේ පැල්වත්ත අංශයේ නිෂ්පාදිත සීනි මත ගෙවිය යුතු රු.92,125,804ක ජාතිය ගොඩනැගීමේ බදු (NBT) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2011 වර්ෂයේ ආයතනය රජයට පවරා ගැනීමෙන් පසුව 2015 දෙසැම්බර් 31 දක්වාම සීනි සඳහා ජාතිය ගොඩනැඟීමේ බද්ද ගෙවා නොතිබුණු නමුත් සෑම වසරක් අවසානයේම වෙන් කිරීම් සිදු කරන ලදී. ඒ පිළිබඳව බදු වාර්තා යවා නොමැති අතර 2021 අංක 18 දරන මුදල් පනතේ 11 වන කොටස යටතේ කපා හරින බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. | හිඟහිට ඇති බදු මුදල් අප්‍රමාදීව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 (1) වගන්තිය | සෑම මසකම අවසාන දිනට ගණනය කරන එකතු කළ අගය මත බදු ඊළඟ මාසයේ 20 වැනි දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවත් 2012 - 2019 වර්ෂ අතර කාලය තුළ එතනෝල් හා මොලෑෂස් අලෙවිය මත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.27,347,134 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ පැවති මූල්‍ය අපහසුතා නිසා ගෙවීමට නොහැකි විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟහිට ඇති බදු මුදල් අප්‍රමාදීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ)1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද නියෝගයන්හි 1 කොටසෙහි 30 වන නියෝගය | සීනි නිෂ්පාදනය හෝ සීනි පිරිපහදු කිරීම සම්බන්ධයෙන් පැල්වත්ත හා සෙවනගල කර්මාන්ත ශාලා සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | 2019 වර්ෂය අවසානය දක්වාම සීනි කර්මාන්තශාලාව හා ස්කාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. සීනි කර්මාන්තශාලාවෙන් පිටවෙන බැගෑස් පරිසරයට එක් නොවී ඒවා එකතු කර ඉවත් කරන තාක්ෂණික ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලද අතර ස්කාගාරය ආශ්‍රිතව කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් 2022 වර්ෂයේදී ආරම්භ කිරීමෙන් පසුව පරිසර බලපත්‍රය ලබාගත හැක. | පරිසර ආරක්ෂණ ක්‍රමවේදයන් ස්ථාපිත කර පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය. |
| (ඈ)2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i)5.2.5 ඡේදය | ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැය ලේඛනයේ පිටපතක් අදාළ වර්ෂය ආරම්භ වී දින 15 ක් ගතවීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2019 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැය ලේඛනයේ පිටපතක් නියමිත දිනයේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ලේඛනය සකස් කර චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 9.3 ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියක් භාවිතා කළ යුතු වුවත් සමාගම විසින් නිලධාරින් බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගෙන නොතිබුණි.ඒ අනුව පවත්නා තනතුරු සංඛ්‍යාව, බඳවාගත් හා උසස්වීම් ලබා දුන් ක්‍රමවේදය හා වැටුප් පරිමාණයන්හි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවාගත යුතුය. |
| (iii)8.3.3(අ) ඡේදය | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කර දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති සහ ලාභ ලබා ඇති ආයතනයකට ප්‍රසාද දීමනා ලබාගත හැකි වුවද, 2018 හා 2019 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන මාස 17 ක් බැගින් ප්‍රමාද කර තිබියදී හා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබියදී සෙවනගල අංශයේ හා ප්‍රධාන කාර්යාලයේ සේවකයෙකුට එක් මසක වැටුප ලෙස 2018 හා 2019 වර්ෂයන්හි පිළිවෙලින් රු.13,514,219 ක හා රු.14,448,180 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | මෙමආයතනය කෘෂිකර්මාන්තයේ නියැලෙන විශාල ආයතනයක් වන බැවින් සේවකයින්ගේ සහ ගොවීන්ගේ සක්‍රිය දායකත්වයක් නොමැතිව පවත්වාගෙනයා නොහැක. එමනිසා අතීතයේ සිට පැවතගෙන එන පරිචයක් ලෙස සේවකයින්ට සහ ගොවීන්ට ප්‍රසාද දීමනා සහ දිරිදීමනා ගෙවීම සිදුකරයි. එමගින් ආයතනයේ නිෂ්පාදන වැඩි දියුණු කරගැනීමට අපේක්ෂා කෙරේ. | චක්‍රලේඛයට පටහැනි ප්‍රසාද දීමනා ආපසු අයකරගත යුතුය. |
| (iv)8.3.3(c)(ii) ඡේදය | ප්‍රසාද දීමනා ගෙවන විට දිරි දීමනා ගෙවිය නොහැකි වුවද, සෙවනගල අංශයේ හා ප්‍රධාන කාර්යාලයේ සේවකයෙකුට රු.75,000 ක් බැගින් හා පැල්වත්ත අංශයේ සේවකයෙකුට රු.25,000 ක් බැගින් 2018 හා 2019 වර්ෂයන්හි පිළිවෙලින් රු.145,356,250 ක හා රු.149,904,111 ක දිරිදීමනාවක් භාණ්ඩාරගාරයේ අනුදැනුමකින් තොරව ගෙවා තිබුණි. | එම | චක්‍රලේඛයට පටහැනි දිරි දීමනා ආපසු අයකරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,362,373,144ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.163,387,023ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,198,986,121ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මුළු ආදායම රු.1,260,608,543 කින් හෙවත් සියයට 19 කින් අඩුවෙද්දී මුළු වියදම රු.2,459,594,664 කින් හෙවත් සියයට 36 කින් වැඩිවීමමෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) පෙර වර්ෂයේ විකුණුම් ආදායම රු.6,242,954,355 ක් හා විකුණුම් පිරිවැය රු.5,025,819,435 ක් වීමෙන් දළ ලාභ අනුපාතය සියයට 19.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.7,545,539,093 ක් හා විකුණුම් පිරිවැය රු.7,522,967,783 ක් වීමෙන්දළ ලාභ අනුපාතය සියයට 0.3 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. පෙර වර්ෂය අවසානයට රු.1,772,165,915 ක් වූ ඉතිරි සීනි තොගය සමාලෝචිත වර්ෂය අවසානයට රු.27,267,100 ක් දක්වා රු.1,744,898,815 කින් අඩුවීම පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් පිරිවැය සියයට 49 කින් ඉහළ යාම මේ කෙරෙහි බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සෙවනගල අංශය විසින් 2018 වර්ෂයේදී ඉන්දියාවෙන් රු.9,564,866 ක වටිනාකමකට රු.3,924,394 ක රේගු ගාස්තුවක් ගෙවා ආනයනය කළ වාෂ්පීකරණ යන්ත්‍රය (Evaporator) සඳහා වන උපාංග (SS Tube)පිරිවිතරවලට එකඟ නොවීම මත ආපසු යවා 2019 වර්ෂයේදී නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු.4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් එය සමාගමට පාඩුවක් වී තිබුණි. තවද, එම රේගු ගාස්තුව ගෙවීමට අදාළ ලියකියවිලි සමාගම සතුව නොතිබීම හේතුවෙන් එම වටිනාකම විදේශීය ඇනවුම් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | ප්‍රසම්පාදන කළමණාකරු විසින් ගෙවන ලද රේගු ගාස්තුව අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සෙවනගල අංශයේ කර්මාණ්තශාලාවේ අවශ්‍යතාවය සඳහා රු.11,412,646 ක මුදලකට 2018 වර්ෂයේදී ඉන්දියාවෙන් ආනයනය කරන ලද විද්‍යුත් චුම්භක බෙදුම් උපකරණ (Electro Magnetic Separator) යන්ත්‍රය යෝග්‍ය තත්ත්වයෙන් පවතින බවට සමාගමේ ඉංජිනේරු විසින් සහතිකය නිකුත් නොකිරීම හේතුවෙන් 2021 අගෝස්තු වන විට වසර 03 කට ආසන්න කාලයක් තිස්සේ සවි කිරීමට කටයුතු නොකර අභාවිතව තිබීමෙන් කළ වියදම නිෂ්කාර්ය වී තිබුණු අතර ගෙවූ මුදල් ප්‍රාග්ධනිත කළ නොහැකිව විදේශීය මිලදී ගැනීම් අත්තිකාරම් | අදාළ උපකරණ ආනයනය කරන ලද ඉන්දියන් සමාගමේ නිලධාරීන් ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය වී ඇති බැවින් පවතින වසංගත රෝග තත්වයන් මත එම කාර්ය ප්‍රමාද වී ඇත. මේ වන විට යළි එම කාර්ය කරවා ගැනීමට අවතීර්ණ වී ඇත. | පරීක්ෂණයක් සිදු කර ප්‍රසම්පාදනයේ දෝෂයක් වේනම් වගකිව යුත්තන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |

යටතේ දක්වා තිබුණි.

| | | |
|---|---|---|
| (ඇ)සෙවනගල අංශයට අයත් භූමියේ ගොඩනැගිලි 03 ක් ව්‍යාපාරිකයන් දෙදෙනෙකුට ගිවිසුම්ගත වීමකින් හෝ ගාස්තු අය කිරීමකින් තොරව සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට 2012 වර්ෂයේ සිට ඉඩකඩ සලසා දී රු.1,279,792 ක ජල සැපයුම ද ලබා දී තිබුණි. | සෙවනගල ආයතනයට එරෙහිව පවතින නඩු කටයුතු හේතුවෙන් පෞද්ගලික ආයෝජකයා සතු ස්ථාන වෙත බලපෑමක් සිදුකිරීමට නොහැකිවී ඇත. | භාහිර පාර්ෂවයන් විසින් පරිහරණය කරනු ලබන සමාගමට අයත් දේපළවල ජල සැපයුම අත්හිටු වීමටත් ඒවා අත්පත් කර ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ) 2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුදල් පොත් ශේෂය රු.17,932,382 ක් වුවද, බැංකු අයිරා ශේෂය රු.614,111,255 ක් වූයෙන් ශුද්ධ මුදල් ශේෂය රු.596,178,873ක සෘණ අගයක් ගෙන තිබුණු අතර එදිනට පැල්වත්ත අංශයේ හා සෙවනගල අංශයේ ශුද්ධ මුදල් ශේෂයන් පිළිවෙලින් රු.555,465,760ක් හා රු.17,768,995 ක් වශයෙන් සෘණ අගයක් ගැනීම ඊට හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලිය රු.75,470,783 ක් වූ අතර පෙර වර්ෂයන්හි තත්ත්වය ද මේ ආකාරයටම විය. තවද, බැංකු ණය හා බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් පැල්වත්ත ඒකකය සතු රු.829,068,708 ක් වන සියලුම ස්ථාවර තැන්පතු ද, සෙවනගල අංශය සතුරු.285,000,000 ක ස්ථාවර තැන්පතු 07 ක් ද ඇපයට තබා තිබුණි. | ආයතනය රජයට පවරා ගැනීමෙන් පසුව 2013 හා 2016 වර්ෂය හැරුණු විට අනෙකුත් සියළුම වර්ෂයන්හිම අලාභ ලබා ඇති හෙයින් මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථාවර තැන්පතු ඇපයට තබාබැංකු ණය හා අයිරා පහසුකම් ලබා ගැනීමට සිදු විය. | වියදම් කළමණාකරනය කර මූල්‍ය තත්ත්වය යහපත් කර ගනිමින් ආයතනය ලාභ ලබන තත්ත්වයට පත්කර ගත යුතුය. |
| (ඉ) සෙවනගල අංශයේ 2017 නොවැම්බර් 01 දින සිට 2019 ජුනි 30 දින දක්වා කාලය සඳහා රු.4,698,431 ක් ද, පැල්වත්ත අංශයේ 2019 ජනවාර් 01 දින සිට මාර්තු 31 දින දක්වා කාලය සඳහා රු.175,642 ක් ද වශයෙන් මොලෑෂස් නිෂ්පාදනය මත ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාද කිරීම හේතුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු එකතුව රු.5,874,073 ක ප්‍රමාද ගාස්තුව කළමනාකරණ අකාර්යක්ෂමතාවය මත සමාගමට වූ පාඩුවක් බවට නිරීක්ෂණය කෙරේ. | සුරාබදු දෙපාර්තුමේන්තුවට ගෙවිය යුතු බදු නියමිත දිනට ගෙවීමට පියවර ගනු ලැබේ. | අකාර්යක්ෂමතාවයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. |
| (ඊ) පැල්වත්ත අංශය විසින් කළමනාකරණ තීරණයක් මත 2012 වර්ෂයේ සිට ගොවි ණය සඳහා අයකරන සියයට 12 ක පොලී ආදායමෙන් සියයට 3 ක් ගොවීන්ගේ සුභසාධනය සඳහා ද, සියයට 1 ක් ආයතනයේ සුභසාධන කටයුතු සඳහා ද වෙන් කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගොවීන්ගේ | 2020 දෙසැම්බර් 31 දින දක්වා ගොවි ණය සඳහා අය කළ සියයට 12 කින් සියයට 3 ක් මෙසේ සුභසාධනය සඳහා වෙන් කළ ද, 2021 වර්ෂයේ සිට එම පොලී අනුපාතය සියයට 8 ක් දක්වා අඩු කිරීමත් සමඟ එම වෙන් කිරීම | මුදල් නැවත ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සුභසාධන ගිණුම රු.91,061,803 ක් ද, ආයතනයේ සුභසාධන ගිණුම රු.30,419,099 ක් ද විය. එසේ වුවද, 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එලෙස වෙන් කරන ලද මුදල්වලින් කිසිදු සුභසාධන කටයුත්තක් සිදු කර නොතිබුණි. | නතර කරනු ලැබීය. | |
| (උ) | සමාගමට පවරාගත් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂයෙන් යල්පැන ගිය තොගය වශයෙන් රු.9,251,437 ක් අඩු කර දක්වා තිබුණද එම තොගය හඳුනා ගැනීමට හැකියාවක් නොතිබුණි. | ආයතනය රජයට පවරා ගැනීමේදී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව පැවති වාහන හා යන්ත්‍ර සූත්‍ර අමතර කොටස්වල යල්පැනගිය තොග සඳහා වූ මෙම වෙන් කිරීමට අදාළ භාණ්ඩ ලැයිස්තුවක් නොතිබුණු අතරඉදිරි භාණ්ඩ සමීක්ෂණයකදී මෙම ශේෂයන් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුත කරනු ලැබේ. | භාණ්ඩ සමීක්ෂණයකින් යල් පැනගිය තොග නිශ්චිතව හඳුනාගත යුතුය. |
| (ඌ) | සෙවනගල ඒකකයේ නිලධාරීන්ට ලබා දී තිබුණු වර්ග 10 කට අයත් නිල නිවාස 300 ක කුලිය වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර ආරම්භයේ පටන් අයකළ රු.20 ත් රු.85 ත් අතර මාසික කුලියක් අය කරමින් තිබුණි. | අනවසර පදිංචිකරුවන් කිසිදු ගෙවල්කුලී ගෙවීමකින් තොරව නිල නිවාස වල රැඳී සිටින අතර සේවකයින් වෙත ලබා දී ඇති වසර 30 කට වඩා පැරණි නිල නිවාස බොහෝමයක අඩුපාඩු සම්පූර්ණ කර දීමට සිදුව ඇත. තක්සේරු දෙපාර්මේන්තුව මගින් නිවාස තක්සේරු කරවා ගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | වර්තමානයට ගැළපෙන පරිදි නිවාස කුලිය සංශෝධනය කළ යුතුය. |
| (එ) | රජයේ කුලී නිවාස සඳහා ජලය, විදුලි බලය හා ගෑස් සඳහා නිලධාරියා විසින් ගෙවීම් කළ යුතු වුවද එසේ සිදු නොකර සෙවනගල ඒකකය විසින් විදුලිය හා ජලය සඳහා පිළිවෙලින් රු.712,671 ක් හා රු.97,240 ක් ගෙවා තිබුණි. | පවතින නෛතික ගැටළු අවසන් වූ පසු නිවාස කුලී, ජල බිල්පත්, හා විදුලි බිල්පත් සඳහා රජයේ පවතින වර්ථමාන මිල ගණන් යටතේ අයකර ගැනීමට කටයුතු කිරීමේ හැකියාව ඇත. | විදුලිය හා ජල ගාස්තු නිලධාරියා විසින් දරාගත යුතුය. සමාගම විසින් ගෙවන ලද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | නිලධාරියෙකු විශ්‍රාම ලබන අවස්ථාවේදී නිල නිවාසයෙන් ඉවත් විය යුතු වුවද විගණිත දිනය වන විට සෙවනගල ඒකකයේ විශ්‍රාම ගොස් තිබුණු සේවකයන් 38 ක් එම නිල නිවාසවලම පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා දැනටමත් නීතිමය පියවර ගෙන ඇත. | සේවකයන් විශ්‍රාම යාමේදී නිල නිවාසවලින් ඉවත් කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීමටත්, දැනට සිටින විශ්‍රාමිකයින් ඉවත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඔ) සමාගමේ මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත බලය ලබාදීමකින් තොරව ගෙවීම් සඳහා බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම කර ගෙවීම් කිරීම සිදු කර තිබුණි. | මූල්‍ය පාලන බලතල පවරාදීමට කටයුතු කරනු ලැබේ. | සමාගමේ මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත බලය ලබාදීම සිදු කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පැල්වත්ත ඒකකයේ 2019 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ත තොගය තුළ වසර 05 සිට 07 කට වැඩි කාලයක් තිස්සේ පැවත එන රු.4,904,160 ක තොග අඩංගු වී පැවතීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | 2014 වර්ෂයට පෙර සිට පවතින මෙම ශේෂය භාණ්ඩවල පිරිවැය අඩුවෙන් ගිණුම්ගත වීම නිසා හටගත් ගිණුම්කරණ දෝෂයක් වන අතර මේ පිළිබඳව තව දුරටත් සොයා බලා ඉදිරියේදී ගිණුම් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | මෙම භාණ්ඩ ලැබී තිබේද යන්න පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට අදාළණය හිමියන් 1379 දෙනෙකුට ගෙවිය යුතු රු.188,485,761ක් වර්ෂ 01 සිට 10 දක්වා කාලයක් නිරවුල් නොවී පැවතීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | මෙම ගෙවිය යුතු ණයහිමි ශේෂයන් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | මෙම ණයහිමියන් සත්‍ය වශයෙන් පවතීද යන්න සොයා බලා සුදුසු පියවර ගත යුතුය. |
| (ඇ) 2012 වර්ෂයේදී “සෙවනගල සුගර් ඉන්ඩස්ට්‍රීස්” ආයතනය රජයට පවරා ගන්නා අවස්ථාවේදී එම ආයතනයේ වගකීම් නිරවුල් කිරීමේ බැඳීමක් නොතිබිය දී එම ආයතනයට අයත් විදුලිය, ජලය, උක් ගස් ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවලට හා ගොවියන්ට ගෙවිය යුතුව තිබුණු රු.38,096,521 ක් හා ඉවත් වූ සේවකයන්ට නිල නිවාස තැන්පතු ආපසු ගෙවීම සඳහා රු.383,833 ක් වශයෙන් එකතුව රු.38,480,354 ක් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ සමාගම විසින් අදාළ පාර්ශවයන්ට ගෙවා නිරවුල් කර තිබීම මතභේදාත්මක කරුණක් විය. | සෙවනගල සුගර් ඉන්ඩස්ට්‍රීස් නමින් ආයතනයක් දැනට නැති හෙයින් ලැබියයුතු මුදලක් වශයෙන් ගිණුම්ගත කිරීම ප්‍රයෝගික නැත. | නිරවුල් කිරීමේ වගකීමක් නොතිබිය දී සිදු කර ඇති මෙම ගෙවීම් පිළිබඳව නැවත විමර්ශණය කළ යුතුය. |
| (ඈ) කාර්යාලයක් පවත්වා ගැනීම සඳහා දේශපාලනඥයකුට ලබා දී ඇති සෙවනගල අංශයේ නිල නිවාසය අත්පත් කර ගැනීමට කටයුතු නොකර 2020 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා කාලයට අදාළව මසකට රු.1,000 | මෙම නිවාස සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එම නඩු කටයුතු අවසන් වූ පසු එහි නියෝග ක්‍රියාත්මක කර ඉදිරි කටයුතු සිදුකිරීමට | නිල නිවාසය අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් බැගින් රු.132,000 ක නිවාස කුලියක් ලබා ගැනීමට කටයුතු කිරීම මතභේදයට තුඩු දෙන්නක් විය. තවද, මසකට රු.2,000 ක් බැගින් රජයේ නිලධාරයෙකුට කුලියට ලබා දී 2016 අප්‍රේල් මාසයේදී ගිවිසුම් කාලය අවසන් වීතිබුණු නිවසක් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බලාපොරොත්තු වේ. | |
| (ඉ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2008 ජනවාරි 01 දින සිට සීනි හා සීනි ආශ්‍රිත නිෂ්පාදන මත වැට් බදු අයකිරීමෙන් සමාගම නිදහස් කර තිබුණු නමුත් සෙවනගල අංශය විසින් දිගින් දිගටම එම නිෂ්පාදන සඳහා වැට් බදු අය කර තිබීම මතභේදාත්මක කරුණක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එම අය කිරීම රු.5,133,694 ක් විය. | සීනි හා සීනි ආශ්‍රිත නිෂ්පාදන මත වැට් බදු අයකිරීමෙන් සමාගම නිදහස් කර තිබීම සම්බන්ධයෙන් අදහස් දක් නොමැත. | බදු අය කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල විය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සෙවනගල අංශය විසින් කාබන්ඩයොක්සයිඩ් වායුව නිෂ්පාදනය කර කිලෝ ග්‍රෑම් 01 ක් රු.25 කට අලෙවි කිරීම සඳහා වසර 20 ක කාලපරිච්ඡේදයකට 2014 වර්ෂයේ දී “ඉන්ඩස්ට්‍රියල් ගෑසස් පුද්ගලික සමාගම” සමඟ ගිවිසුමකට එළැඹ තිබුණු මුත් “ලංකා කාබොනික් ඉන්ඩස්ට්‍රීස්” නම් වෙනත් සමාගමක් වෙත ගෑස් අලෙවි කර තිබුණි. එසේම ගෑස් අලෙවිය වෙනුවෙන් 2015 හා 2016 වර්ෂයන්හි ලැබිය යුතු රු.7,473,696 ක් ඇතුළුව 2019 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.17,770,596ක් අය කර ගැනීමටත්, වසර 05 ක කාලයක් තිස්සේ අලෙවි මිල සංශෝධනය කර ගැනීමටත්, නිෂ්පාදිත කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මැනීම පිණිස මීටරයක් සවිකිරීමටත් කටයුතු නොකිරීමෙන් කාබන්ඩයොක්සයිඩ් අලෙවියෙන් නිසි ලෙස ආදායම් ලබාගන්නා බවට සෑහීමකට පත් විය නොහැකිව ඇත. | කාබන්ඩයොක්සයිඩ් විකුණුම් මිල 2021 දෙසැම්බර් 31 දින සිට සංශෝධන කර ඇත. ස්ථාපිත කර ඇති බර කිරුම් පුවරුව භාවිතා කරමින් බර කිරීම සිදුකර ටිකට් පතක් මඟින් සනාථ කරගෙන ඉන්වොයිස් නිකුත් කෙරේ. ගිවිසුම්ගත සමාගමට කාබන්ඩයොක්සයිඩ් වායුව අලෙවි නොකර වෙනත් සමාගමකට අලෙවි කිරීම හා ලැබිය යුතු මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | මිල සංශෝධනය කර ගැනීමටත්, නිෂ්පාදිත කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මැනීම පිණිස මීටරයක් සවිකිරීමටත්, අයවිය යුතු මුදල් අයකර ගැනීමටත්, ගිවිසුම්ගත ආකාරයට කටයුතු කිරීමටත් පියවරගත යුතුය. |
| (ආ)සමාගමේ කර්මාන්තශාලාවල උපරිම ධාරිතාවය උක් මෙට්‍රික් ටොන් 897,500ක් වුවද, 2019 වර්ෂයේ උක් සැපයුම මෙට්‍රික් ටොන් 571,370ක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාවිතා වී තිබුණේ කර්මාන්තශාලාවල ධාරිතාවෙන් සියයට 63 ක ප්‍රතිශතයකි. උක් සැපයුම අඩුවීම සමාගමේ කර්මාන්තශාලාවල උපරිම ධාරිතා මට්ටම ලබා | වර්ෂාපතනය අඩු වීම, පොහොර සහ කෘෂි රසායනිත ද්‍රව්‍ය හිඟය හේතුවෙන් අස්වැන්න අඩුවී උක් ඇඹරුම් ප්‍රමාණය අඩුවිය.ගල් අමුණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, කුඩා වැව් සංවර්ධනය කිරීම, කුඩා වැසි දිය පොකුණු ඉදි කිරීම, වගා ලිං ඉදිකර ගැනීම | කර්මාන්තශාලාවල උපරිම ධාරිතාවයටසරිලන සේ උක් සපයා ගැනීමට සැසුම් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර ගැනීමට නොහැකි වීමට හේතු වී තිබුණි. | සඳහා ගොවීන්ට ආධාර ලබාදීම, වතුර පොම්ප හා ජලනල ලබාදීම, පොහොර හා කෘමිනාශක සැපයීම, පිටස්තර ගොවි ඉඩම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීම, උක් සඳහා ඉහළ මිලක් ගෙවීම වැනි ක්‍රම මඟින් සැපයුම වැඩි කර ගැනීමට උත්සහ දරමින් සිටී. | |
| (ඇ) 2018 වර්ෂයේ ලීටර් 9,787,259ක් වූ සමාගමේ එතනෝල් නිෂ්පාදනය, ඉල්ලුමේ අඩුවීම හේතුවෙන් 2019 වර්ෂයේ ලීටර් 5,212,560ක් දක්වා සියයට 47ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි . | එතනෝල් ආනයනය කිරීමට පෙළඹීම මත රු.290 ක මිල යටතේ අලෙවිය සීමාවී 2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී නිෂ්පාදනය පහත වැටී ඇත. නමුත් 2020 වසරේදී එතනෝල් ආනයනය නතර කිරීමට රජය කටයුතු කර ලීටරයක් සඳහා රු.500 ක ස්ථාවර මිලක් ද නියම කිරීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂයන්හි නිෂ්පාදනය හා විකුණුම් ආදායම ද ඉහළ ගොස් ඇත. | නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ)පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ වාර්ෂික සීනි නිෂ්පාදනය 2018වර්ෂයේ මෙට්‍රික් ටොන් 28,061ක් වූ අතර 2019 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 25,162ක් ලෙස සියයට 10 කින් අඩු වි තිබුණි .උක් සැපයුම හා ඒවායේ සීනි ප්‍රතිශතය අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණු නමුත් ඒවා වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | 2018 වසරේ උක් සැපයුම මෙට්‍රික් ටොන් 371,694 ක් හා සීනි උකහා ගැනීමේ හැකියාව සියයට 7.55 ක් වුවද, 2019 වසරේදී උක් සැපයුම මෙට්‍රික් ටොන් 330,824 ක් හා උකහා ගැනීමේ හැකියාව සියයට 7.61 ක් විය. පොහොර හිඟය ද මේ සඳහා බලපාන ලදී. | උක් සැපයුම හා සීනි ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඉ) සෙවනගල ඒකකයට අයත් උක් වගා කළ හැකි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 4, 215ක් වුවද, 2019වර්ෂය අවසාන වන විට වගා කර තිබූ මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 3, 240ක් විය. මේ අනුව කර්මාන්තශාලාවේ මෙහෙයුම් උපරිම ධාරිතාවයෙන් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් උක් සැපයුමක් ලබා දිය හැකි ඉඩම් සෙවනගල ඒකකය සතුව තිබුණද එම ඉඩම්වල උක් වගා කර කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණි. | යළි වගා කිරීම සඳහා ඉඩම් සකස් කිරීම, ශෂ්‍ය බෝග මාරුව, බීජ උක් නෙලීම, හා නියඟය වැනි හේතූන් මත සම්පූර්ණ වගා බිම් ප්‍රමාණයක් නොතිබුණ ද නිරන්තරයෙන් උක් වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත | මුළු ඉඩම් ප්‍රමාණයම වගා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සෙවනගල අංශය සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ඇනවුම සමඟ එම ඇනවුමට අදාළ සම්පූර්ණ මුදලම අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණු අතර වසර 01 සිට වසර 07 ක් දක්වා කාලයක් තුළ දේශීය සැපයුම්කරුවන් 21 දෙනෙකුට ලබා දී තිබූ රු.12,965,197 ක අත්තිකාරම් හා විදේශීය සැපයුම්කරුවන් 35 දෙනෙකුට ලබා දී තිබූ රු.6,524,060 ක අත්තිකාරම් 2021 ජූලි 31 විගණිත දින වන විටත් පියවා නොතිබුණි. එසේම මෙම භාණ්ඩ බඩු ලේඛන පොත්වල ඇතුළත් කර භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදු කර නොතිබුණි. | මිලදී ගැනීම් අත්තිකාරම් කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් ඇත. | නොපිය වූ අත්තිකාරම් පිළිබඳව කඩිනමින් සොයා බලා පියවා ගැනීමටත්, මිලදී ගැනීම් සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙවනගල අංශය විසින් රු.27,067,812 ක යන්ත්‍රෝපකරණ මිලදී ගනිමින් 2013 වර්ෂයේදී ආරම්භ කර 2014 වර්ෂයේදී නවතා දමා තිබුණු අප ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය සහ රු.2,864,444 ක වියදමකින් 2014 වර්ෂයේදී ඉදිකළ භාවිතයට නොගන්නා නළ ළිං ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණු අතර වැය කළ වියදම වසර ගණනාවක සිට කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාගමට පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ද නොහැකි වී තිබුණි. | අපජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය අවසන් වී නොමැත. පර්යේෂණ කටුයුත්තක් ලෙස සිදුකරන ලද නළ ළිං ඉදිකිරීම සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුවෙමින් පවතී. | මෙම ව්‍යාපෘතීන් අසාර්ථක වීමට හේතු සොයාබලා එය සක්‍රීය කිරීමට හෝ යමෙකුගේ නොසැලකිල්ලක් වේ නම් එයට එරෙහිව විනය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පැල්වත්ත අංශය2011 වර්ෂයට පෙර රු.37,982,159 ක් වැය කරආරම්භ කළ ව්‍යාපෘති 02 ක් ද, 2011 – 2015 වර්ෂ අතර කාලය තුළ රු.55,915,893 ක් වැය කර ආරම්භ කළ ව්‍යාපෘති 17 ක් ද වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණි. මෙම වැය කිරීම් මතභේදකාරී හා නිෂ්කාර්ය බවත්, වියදම් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. . | අවසන් කිරීම සම්බන්ධයෙන් කිසිම වාර්තාවක් නොමැති වීම, ව්‍යාපෘති වැඩ නිම කර නොමැති වීම,ව්‍යාපෘති අතරමඟ නවතා දමා තිබීම, උක් දඬු ඇතුළත් කිරීමේ දොඹකර ව්‍යාපෘතිය භාරදීමට පෙර බිඳ වැටීම, ව්‍යාපෘති 02 ක් ආයතනය රජයට පවරා ගැනීමේදී ගිණුම්වල ඇතුළත් වියදමක් වීම හේතු වී ඇත. | මතභේදකාරී හා නිෂ්කාර්ය වූ මෙම වැය කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පැල්වත්ත ඒකකය තුළ ගොල්ෆ් ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යාම හා එහි නඩත්තු වැටුප් ගෙවීම සඳහා 2018 හා 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.6,232,595 ක් හා රු.6,618,123 ක් වැය කර තිබුණු නමුත්, ක්‍රීඩාංගනය ගොල්ෆ් ක්‍රීඩාව සඳහා යොදාගෙන නොතිබීම හේතුවෙන්වැය කළ මුදල් නිෂ්කාර්ය වී ඇති බවට නිරීක්ෂණය විය. | රජයට පවරා ගැනීමෙන් පසුව ගොල්ෆ් ක්‍රීඩාංගනය භාවිතා නොකළ ද ඒවා නඩත්තු කළ යුතු හෙයින් ඒ සඳහා සේවක වැටුප් ගෙවා ඇත. ක්‍රීඩාංගනය භාවිතයට ගැනීම සඳහා අවධානය යොමු කර ඇත. | මෙම ක්‍රීඩාංගනය උපයෝජනය පිණිස සැලසුම් සකස් කළ යුතුය. |
| (ඇ) පැල්වත්ත අංශය 2013 වර්ෂයේදී කල් බදු පහසුකම් යටතේ රු.128,910,000 ක වටිනාකම ඇති ක්‍රේන් යන්ත්‍රයක් මිලදීගෙන ඒ සඳහා රු.120,750,000 ක මුදලක් ගෙවාර්ට අවශ්‍ය විදුලිය සැපයීමට ද රු.2,254,850 ක් වැය කර තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් එකඟ වූ පරිදි එම යන්ත්‍රය කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම හේතුවෙන් මිලදීගත් දින සිට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකිව පැවතීමෙන් වැය කළ රු.123,004,850 ක මුදල නිෂ්කාර්ය වියදම් වී තිබුණි. | කර්මාන්තශාලාවට උක්දඬු ඇතුල් කිරීම සඳහා මිලදීගෙන මාස 03 ක් වැනි කාලයක් තුළ බිඳ වැටීමට ලක් වූ මෙම ක්‍රේන් යන්ත්‍රය අළුත්වැඩියාවන් සිදු කළ නමුත් එය සාර්ථක නොවීය. යන්ත්‍රයේ එක් කොටසකට අදාළ පිරිවැය රු.11,812,500 ක මුදලසඳහා කල්බදු වටිනාකම ගෙවීම අත්හිටුවා ඇත. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ෂණ අංශය විමර්ෂණයක් සිදු කළ ද අවසාන තීරණයක් ලබාදී නොමැත. | අභ්‍යන්තර විමර්ෂණයක් මඟින් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මූල්‍ය අපරාධ විමර්ෂණ අංශයේ විමර්ෂණ කටයුතුවල ප්‍රගතිය සොයා බලා එය ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 වර්ෂයේ ලිපිකරු තනතුරට බඳවාගත් නිලධාරිණියගේ ඉල්ලීම හා සේවා පළපුරුද්ද පමණක් සැලකිල්ලට ගෙන කළමණාකරු (මූල්‍ය) තනතුර දක්වා උසස්වීම් ලබාදී තිබුණු අතර නිසි පත් කිරීමේ බලධාරියා වන සභාපති විසින් විධිමත් ලෙස පත් කිරීමක් සිදු නොකර එම නිලධාරිණිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් රු.15,000 ක වැඩ බැලීමේ දීමනාවක්, රු.15,000 ක ඉන්ධන දීමනාවක් හා රු.50,000 ක වාහන දීමනාවක් 2018 මැයි මස සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මාසිකව ලබා දී තිබුණි. | මේ සම්බන්ධව තවදුරටත් පරීක්ෂා කළයුතුව ඇති බවට දන්වා ඇත. | සමාගම සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවා ගත යුතු අතර සියලු බඳවා ගැනීම් ඊට අනුකූලව සිදු කළ යුතුය. වැඩ බැලීමේ දීමනා ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br><br>VII වැනි පරිච්ඡේදයේ සඳහන් උපදෙස්වලට අනුකූලව විය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍යප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 18ක් ප්‍රමාද වී 2021 අගෝස්තු 16 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමග මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |